# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1004/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/06/2024<br>පැය 1320 |

**නාරාහේන්පිට පොලිස් ස්ථානයේ නවීකරණය කරන ලද භෝජනාගාරය සහ කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම.**

නාරාහේන්පිට පොලිස් ස්ථානයේ වායුසමීකරණය කර නවීකරණය කරන ලද භෝජනාගාරය සහ කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන් 2024 ජූනි මස 14 වන අද දින පෙරවරු 08.30 නාරාහේන්පිට පොලිස් ස්ථානයේදී පැවැත්විණි.

මෙම භෝජනාගාරය හා කාය වර්ධන මධ්‍යස්ථානය නවීකරණය කිරීම ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ උපදෙස් මත පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ මඟ පෙන්වීම සහ කොළඹ දකුණ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නෙරංජන් අබේවර්ධන මහතාගේ අධීක්ෂණය යටතේ නවීකරණය කටයුතු සිදුකරන ලද අතර මෙම නවීකරණ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 30 ක පමණ මුදලක් වැය වී ඇත. සිවිල් ආරක්ෂක දෙපාර්මේන්තුවේ නිලධාරීන්ගේ සහයෝගයෙන් හා පොලිස් ත්‍යාග අරමුදලින් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මෙම ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

මේ අවස්ථාවට බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා , කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර මහතා, කොළඹ දකුණ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නෙරංජන් අබේවර්ධන මහතා ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**